# මූලික පොත්, පාලන ගිණුම් හා ශේෂ පිරික්සුම
# 02 කොටස

**AAT අදියර I**

FAC - මූල්‍ය ගිණුම්කරණය


සංදීප ජයසේකර

MBA (PIM-SJP), B.Sc. (Acct.) Hons. Gold Medal Winner, ACA, SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner, Visiting Lecturer – Colombo University



JMC Jayasekera Management Centre (Pvt) Ltd

Pioneers in Professional Education

65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

නැවත විකිණීමේ පරමාර්ථයෙන් ණයට ගන්නා සියළුම තොග ගැනුම් වාර්තා කිරීමට ගැනුම් ජර්නලය භාවිතා කරයි

# ගැනුම් ජර්නලය

## ගැනුම් ජර්නල ආකෘතිය

| දිනය | ඉන්වොයිස් අංකය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|
| 20X0/3/04 | 123 | සසිරි සමාගම | 172,500 |
| 20X0/3/05 | 798 | පියල් සමාගම | 230,000 |
| 20X0/3/06 | 656 | අසීස් සමාගම | 92,000 |
| | | | 494,500 |

**ද්විත්ව සටහන**
ගැනුම් ගිණුම හර 494,500
ණයහිමි පාලන බැර 494,500



JMC vLearning
your virtual learning partner

# ප්‍රශ්න 08

අරවින්දගේ ව්‍යාපාරයේ ණයට ගැනුම් සම්බන්ධයෙන් පහත විස්තර සපයා ඇත

5/1 ලැයිස්තු මිල රු. 50,000ක් වූ අයිතම වෙළඳ වට්ටම් 10%කට යටත්ව අර්ජුනගෙන් ණයට ගන්නා ලදි (ඉන්වොයිස් අංකය 7659)
5/5 සනත්ගෙන් ණයට ගැනුම් රු. 10,000 (ඉන්වොයිස් අංකය 5459)
5/10 ලැයිස්තු මිල රු. 25,000ක් වූ අයිතම වෙළඳ වට්ටම් 10%කට යටත්ව මිලට ගන්නා ලදි (ගෙවීම් වවුචර අංක 122)
5/25 ලැයිස්තු මිල රු. 20,000ක් වූ අයිතම වෙළඳ වට්ටම් 5%කට යටත්ව ඔපුල්ගෙන් ණයට ගන්නා ලදි (ඉන්වොයිස් අංකය 8542)
5/30 10% වෙළඳ වට්ටම අඩු කළ පසු රොමේශ්ගෙන් ණයට ගැනුම් රු. 9,000 (ඉන්වොයිස් අංකය 1464)

**අවශ්‍ය වන්නේ**
ගැනුම් ජර්නලය සහ ලෙජර ගිණුම්

# 2021 ජූලි 5 (B)

**සංඛ ට්‍රේඩර්ස්**, ඒකලස්වාමි ව්‍යාපාරයක් වන අතර, ව්‍යාපාරයේ ගිණුම් පොත්වලින් පහත සඳහන් ණයට මිලදී ගැනීමේ ගනුදෙනු 2021 මාර්තු මාසය සඳහා උපුටා ගන්නා ලදී.

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරුගේ නම | විස්තරය | ප්‍රමාණය | ඒකකයක මිල(රු.) | වෙළඳ වට්ටම් |
|---|---|---|---|---|---|---|
| මාර්තු 01 | 465 | නිමල් සහ සමාගම | සහල් මළු | 50 | 500 | - |
| මාර්තු 10 | 950 | සමන්ත ග්‍රොසරි | සීනි මළු | 100 | 2,000 | - |
| මාර්තු 15 | 495 | නිමල් සහ සමාගම | සහල් මළු | 100 | 500 | 5% |

ඔබ විසින් කළ යුතු දෑ:

2021 මාර්තු මාසය සඳහා **සංඛ ට්‍රේඩර්ස්** හි දෛනික ගැනුම් පොත (ගැනුම් ජර්නලය) පිළියෙල කරන්න.



# විකුණුම් ජර්නලය

ව්‍යාපාරයේ සියළුම ණයට විකුණුම් වාර්තා කිරීමට විකුණුම් ජර්නලය භාවිතා කරයි

## විකුණුම් ජර්නල ආකෘතිය

| දිනය | ඉන්වොයිස් අංකය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|
| 20X0/3/04 | 556 | රසික | 300,000 |
| 20X0/3/05 | 557 | සුදේශ් | 200,000 |
| 20X0/3/06 | 558 | අමිල | 100,000 |
| | | | 600,000 |

**ද්විත්ව සටහන**
ණයගැති පාලන හර 600,000
විකුණුම් බැර 600,000



JMC vLearning "your virtual learning partner"

# 2019 ජුලි 5 (B)

අමල් ස්ටෝර්ස් ලිපිද්‍රව්‍ය විකිණීමේ නිරත කේවලස්වාමි ව්‍යාපාරයකි. 2019 මාර්තු මාසය සඳහා අමල් ස්ටෝර් හි ණයට විකුණුම් පහත පරිදි වේ.

| දිනය | ඉන්වොයිස් අංකය | ගනුදෙනුකරුගේ නම | අයිතම විස්තර | | | |
|---|---|---|---|---|---|---|
| | | | විස්තරය | ප්‍රමාණය | ඒකක මිල (රු.) | වෙළඳ වට්ටම |
| 2019.03.02 | 217 | ABC සමාගම | CR පොත් | 75 | 140 | |
| 2019.03.10 | 218 | කමල් | පැන්සල් | 120 | 6 | |
| 2019.03.25 | 219 | පෙරේරා | පෑන් | 180 | 8 | |

ඔබ විසින් කළ යුතු දෑ:

2019 මාර්තු මාසය සඳහා **අමල් ස්ටෝර්ස්** හි විකුණුම් ජර්නලය පිළියෙල කරන්න.



# 2021 ජනවාරි 5 (B)

2021 ජනවාරි මාසය තුල පෙරේරා ව්‍යාපාරයේ පහත දැක්වෙන ණයට විකුණුම් ගනුදෙනු සිදු වී ඇත

| දිනය | ඉන්වොයිස් අංකය | ගනුදෙනුකරුගේ නම | අයිතම විස්තර | | | |
|---|---|---|---|---|---|---|
| | | | විස්තරය | ප්‍රමාණය | ඒකක මිල (රු.) | වෙළඳ වට්ටම |
| 2021.01.05 | 101 | ABC සමාගම | කමිස | 10 | 800 | - |
| 2021.01.25 | 102 | XYZ ට්‍රේඩර්ස් | ගවුම් | 08 | 1,200 | 10% |

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2021 ජනවාරි මාසය අවසානයේදී විකුණුම් ගිණුමට මාරු කළ යුතු වටිනාකම ගණනය කරන්න.



JMC vLearning "your virtual learning partner"

ණයට ගැනුම් කළ තොග, ණයහිමියන්ට නැවත හරවා යැවීම් වාර්තා කරයි

## ගැනුම් ආපසු යැවුම් ජර්නලය

**ගැනුම් ආපසු යැවුම් ජර්නලය**

| දිනය | හරපත් අංකය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|
| 20X0/3/05 | 124 | ඔමේගා සමාගම | 20,000 |
| 20X0/3/03 | 125 | ගැටෝ සමාගම | 30,000 |
| | | | 50,000 |

**ද්විත්ව සටහන**
ණයහිමි පාලන හර 50,000
ගැනුම් ආපසු යැවුම් බැර 50,000



JMC vLearning your virtual learning partner

## ප්‍රශ්න 09

පහත ගනුදෙනු දෙවන්ගාගේ ලී භාණ්ඩ ව්‍යාපාරයේ අගෝස්තු මාසයට අදාළ වේ.

8-2 හරපත් අංක 234 යටතේ කමල් වෙත හරවා යැවූ එකක් රු. 2,000 පිරිවැය වූ මේස 5
8-15 හරපත් අංක 235 යටතේ නිමල් වෙත හරවා යැවූ එකක් රු. 500 පිරිවැය වූ පුටු 10

අවශ්‍ය වන්නේ
ආපසු යැවුම් ජර්නලය පිළියෙල කරන්න

# ප්‍රශ්න 10

පහත තොරතුරු තුලින් සුරාජ්ගේ ව්‍යාපාරයේ ගැනුම් ජර්නලය සහ ගැනුම් ආපසු යැවුම් ජර්නලය පිළියෙල කරන්න

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | විස්තරය | ආපසු යැවුම් |
|---|---|---|---|---|
| 10/08/20X5 | 22 | A සමාගම | එකක් රු. 300 බැගින් කලිසම් 10 (වෙළඳ වට්ටම 10%) | 12/08/20X5 2 කලිසම් |
| 15/08/20X5 | 764 | B සමාගම | එකක් රු. 250 බැගින් කමිස 20 (වෙළඳ වට්ටම 5%) | |
| 21/08/20X5 | 152 | C සමාගම | රු. 150 බැගින් ටී ෂර්ට් 2 | |
| 28/08/20X5 | 2642 | D සමාගම | රු. 400 බැගින් ගවුම් 15ක් (වෙළඳ වට්ටම 5%) | 29/08/20X5 3 ගවුම් |
| 30/08/20X5 | 12 | E සමාගම | රු. 170 බැගින් බ්ලවුස් 10 | |

ණයට විකුණූ භාණ්ඩ ණයගැතියන් විසින් ආපසු එවීම වාර්තා කරයි

# විකුණුම් ආපසු එවුම් ජර්නලය

| විකුණුම් ආපසු එවුම් ජර්නලය | | | |
|---|---|---|---|
| දිනය | බැරපත් අංකය | විස්තරය | වටිනාකම |
| 20X0/3/05 | 586 | සුනිල් | 10,000 |
| 20X0/3/03 | 587 | ශාන්ත | 15,000 |
| | | | 25,000 |

**ද්විත්ව සටහන**
විකුණුම් ආපසු එවුම් හර 25,000
ණයගැති පාලන ගිණුම බැර 25,000

# ප්‍රශ්න 11

හසලි සමාගමේ විකුණුම් ආපසු එවුම් සඳහා පහත විස්තර අදාළ වේ

9/15 රු. 22,000ක අයිතම රජීව විසින් ආපසු එවන ලදි (බැර පත් අංකය 578).
9/20 රු. 11,000ක අයිතම සුජීව විසින් ආපසු එවන ලදි (බැර පත් අංකය 579).

අවශ්‍ය වන්නේ
විකුණුම් ආපසු එවුම් ජර්නලය සහ ලෙජර ගිණුම්

# ප්‍රශ්න 12

පහත ගනුදෙනු ජනවාරි 20X8 මාසය තුළ රෝහිනීගේ ව්‍යාපාරයට අදාළ වේ

ජනවාරි 08 දින මෝහිනී සමාගමට ඉන්වොයිසිය අංක 525 යටතේ පහත අයිතම  විකුණන ලදි
පුටු 150ක් එකක් රු. 500 බැගින්
මේස 30ක් එකක් රු. 900 බැගින්
වෙළඳ වට්ටම් 5%

ජනවාරි 16 දින දේහිනි සමාගමට ඉන්වොයිසිය අංක 526 යටතේ පහත අයිතම  විකුණන ලදි
කබඩ් 05ක් එකක් රු. 5,000 බැගින්
කැබිනට් 10ක් එකක් රු. 8,000 බැගින්
වෙළඳ වට්ටම් 2%

පෙබරවාරි 05 දින මෝහිනී සමාගම විසින් පහත අයිතම ආපසු එවන ලදි (බැරපත් අංකය 48)
පුටු 10ක්
මේස 2ක්

පෙබරවාරි 28 දින දේහිනි සමාගම විසින් පහත අයිතම ආපසු එවන ලදි (බැරපත් අංකය 49)
කැබිනට් 2ක්
කබඩ් 1ක්

අවශ්‍ය වන්නේ
ඉහත ගනුදෙනු අදාළ ජර්නල්වල වාර්තා කර ලෙජර ගිණුම් වෙත තුල සටහන් කිරීම

## පොදු ජර්නලය

- අප විසින් පෙර සාකච්ඡා කළ වෙනත් කිසිදු මූලික පොතක වාර්තා කළ නොහැකි අනිකුත් සියළුම ගනුදෙනු වාර්තා කිරීම සඳහා පොදු ජර්නලය භාවිතා කරයි
- පොදු ජර්නලයේ ගනුදෙනු වාර්තා කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛණය ජර්නල් වව්චරය වේ





JMC vLearning "your virtual learning partner"

# 2021 ජුලි 1.13

පහත ප්‍රකාශය සත්‍යයද අසත්‍යයද යන්න සඳහන් කරන්න


1.13 පොදු ජර්නලය මූලික පොතක් වේ



JMC vLearning "your virtual learning partner"

# පොදු ජර්නලයේ ආකෘතිය

| දිනය | ජර්නල් වව්චර අංකය | විස්තරය | හර රු | බැර රු |
|---|---|---|---|---|
| | | හර වන ගිණුමේ නම | XXX | |
| | | බැර වන ගිණුමේ නම | | XXX |
| | | (සංලක්ෂය - ගනුදෙනුව පිළිබඳ කෙටි විස්තරයක්) | | |




## 2020 ජූලි 1.18

**පොදු ජර්නලය තුල වාර්තා කරන ගනුදෙනු වර්ග 2ක් සඳහන් කරන්න**

Sandeepa Jayasekera - JMC 18

JMC vLearning "your virtual learning partner"

# 2022 ජනවාරි 1.16

පහත සඳහන් ගනුදෙනු අතුරින් පොදු ජර්නලය තුල වාර්තා කරන ගනුදෙනුව තෝරන්න

1. ණය පදනම මත කාර්යාල පරිහරණය සඳහා මෝටර් රථයක් මිලට ගැනීම
2. ණය පදනම මත මිලට ගත් භාණ්ඩ ණයහිමියා වෙත ආපසු යැවීම
3. කාර්යාලීය භාවිතය සඳහා පරිගණකයක් මිලට ගැනීම
4. ණය පදනම මත භාණ්ඩ විකිණීම



# 2022 ජනවාරි 1.11

පහත ප්‍රකාශය සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න

ණය පදනම මත කාර්යාලීය භාවිතය සඳහා කාර්යාල උපකරණ මිලට ගැනීම පොදු ජර්නලය තුල සටහන් කරයි



JMC vLearning "your virtual learning partner"

# 2023 ජනවාරි 1.12

පහත ප්‍රකාශය සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න

දේපල, පිරියත සහ උපකරණ මිලට ගැනීම් සහ විකිණීම් පොදු ජර්නලය තුල සටහන් කරනු ලබයි

02 Marks



JMC vLearning "your virtual learning partner"

# ආරම්භක ශේෂ වාර්තා කිරීම

ව්‍යාපාරයක මූල්‍ය වර්ෂය ආරම්භයේදී පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ වත්කම්, වගකීම් සහ හිමිකම්වල ආරම්භක ශේෂ අදාළ ලෙජර ගිණුම් තුල වාර්තා කළ යුතුය. වත්කම්, වගකීම් සහ හිමිකම්වල ආරම්භක ශේෂ වාර්තා කිරීමට යොදන සටහන පොදු ජර්නලය තුල වාර්තා කරයි.
මේ සඳහා මූලික ගිණුම්කරණ සමීකරණය පදනමක් ලෙස භාවිතා කරයි.

**හිමිකම් = වත්කම් – වගකීම්**

# ප්‍රශ්න අංක 14

**පහත ආරම්භක ශේෂ පොදු ජර්නලය තුල වාර්තා කරන්න**

| **විස්තරය** | **රු** |
|---|---|
| මෝටර් රථය | 1,000,000 |
| තොගය | 200,000 |
| යන්ත්‍ර | 1,500,000 |
| බැංකු ණය | 350,000 |
| ණයගැතියෝ | 320,000 |
| ණයහිමියෝ | 640,000 |
| මුදල් | 500,000 |
| උපචිත වියදම් | 30,000 |
| කලින් කළ වියදම් | 20,000 |

# 2020 ජනවාරි 5 (b)

කේවලස්වාමි ව්‍යාපාරයක් වන **සමරවීර ට්‍රේඩර්ස් හි** පොත් වලින් 2019 මාර්තු 31 දිනෙන් අවසන් මාසය සඳහා පහත සඳහන් ගනුදෙනු උපුටා ගන්නා ලදි

1. 2019 මාර්තු 01 දින, ව්‍යාපාරයේ අයිතිකරු වන **සමරවීර** විසින්, රු.750,000/- ක් වටිනා තම පෞද්ගලික මෝටර් රථය ව්‍යාපාරය වෙත පවරා දෙන ලදි
2. 2019 මාර්තු 15 දින, යන්ත්‍රයක් රු.250,000/- කට **සීමාසහිත** XY **සමාගමෙන්** ණය පදනම මත මිලදී ගන්නා ලදි
3. රු.25,000/-ක විදුලි බිල්පතක්, දුරකතන වියදම් ගිණුමට හර කර ඇති අතර, එයට අදාල අනෙක් සටහන නිවැරදිව සටහන් කර තිබුණි.

ඔබ විසින් කළ යුතු දෑ:

ඉහත ගනුදෙනු වාර්තා කිරීම සඳහා පොදු ජර්නලය පිළියෙල කරන්න.



JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්න අංක 15

සිනාමනා ව්‍යාපාරය සඳහා පහත විස්තර අදාළ වේ

1/1 ආරම්භක ශේෂයන්

- මුදල් 150,000
- ණයගැතියන් 30,000
- ණයහිමියන් 25,000

1/2 ණය පදනම මත කුමාරගෙන් මිලදී ගත් භාණ්ඩ (ඉන්වොයිස් අංකය 234) රු. 20,000 කි. වෙළඳ වට්ටම් 5%.

1/4 අයිතිකරු වන නිමල් රු. 50,000 ව්‍යාපාරයට අතිරේක ප්‍රාග්ධනයක් යොදවන ලදි. (මුදල් ලදුපත අංකය 455)

1/5 රු. 40,000ක භාණ්ඩ මුදලට විකුණන ලදි. (මුදල් ලදුපත් අංකය 456)

1/8 ගොඩනැගිලි කුළී ගෙවීම් රු. 5,000 (ගෙවීම් වවුචර් අංකය 225)

1/10 කුමාර වෙත ආපසු හරවා යවන ලද භාණ්ඩ (හර සටහන් අංකය 114) රු. 5,000කි (වෙළඳ වට්ටම අඩු කිරීමෙන් පසු වටිනාකම)

1/12 ඉන්වොයිසිය අංක 566 යටතේ විමල්ට ණයට විකුණන ලද භාණ්ඩ රු 50,000 කි. වෙළඳ වට්ටම් 10%.

1/15 බැංකු ණයක් ලබා ගන්නා ලදි රු. 25,000 (මුදල් ලදුපත අංකය 457)

1/20 විමල් විසින් රු. 10,000ක (වට්ටමට පෙර වටිනාකම) භාණ්ඩ ආපසු හරවා එවන ලදි (බැරපත් අංකය 588)

1/25 යන්ත්‍රයක් මිලදී ගන්න ලදි රු. 20,000 (ගෙවීම් වවුචර අංකය 226)

1/30 රු. 3,000ක බැංකු ණය වාරිකය ගෙවන ලදි. එම වාරිකය තුල ඇතුලත් වූ පොළිය රු. 1,000කි (ගෙවීම් වවුචර් අංකය 227)

අවශ්‍ය වන්නේ

මූලික පොත් තුල ඉහත ගනුදෙනු වාර්තා කර ලෙජර ගිණුම් පිළියෙල කරන්න

JMC vLearning "your virtual learning partner"


# පොදු ලෙජරය





JMC vLearning
"your virtual learning partner"

# මූලික පොත්වල එකතුව ලෙජරය තුල වාර්තා කිරීම



මූලික පොත්

තොරතුරු වර්ගීකරණය වේ




ලෙජරය



## ලෙජරයක් කියන්නේ මොකද්ද?


## ලෙජරයක් කියන්නේ මොකද්ද?

ලෙජරයක් යනු භෞතිකව හෝ විද්‍යුත් මාධ්‍යයෙන් තබා ගන්නා ගිණුම්වල එකතුවකි. ගිණුම්කරණයේදි ලෙජර ගිණුම් සඳහා පහත දැක්වෙන පරිදි ගිණුමක ආකෘතිය භාවිතා කරයි. වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම්, වියදම් ලෙස ලෙජර ගිණුම් වර්ග 5ක් ඇත.

මූලික පොත්වල එකතුව කාලීනව (මාසිකව හෝ සතිපතා) ලෙජර ගිණුම තුල ද්විත්ව සටහන් න්‍යායට අනුව හර සහ බැර ලෙස වාර්තා කරයි.

| හර පැත්ත | බැර පැත්ත |
| --- | --- |
| | |

30




## 2018 ජුලි 1.5

ලෙජර ගිණුම්වල සාම්ප්‍රදායික වර්ගීකරණය යටතේ, ලෙජර් ගිණුම් මූර්ත ගිණුම්, පුද්ගලික ගිණුම්, සහ නාමික ගිණුම් ලෙස වර්ග කළ හැක.
මූර්ත ගිණුමක් සඳහා උදාහරණයක් වන්නේ පහත සඳහන් ඒවායින් කුමක්ද?

1 විකුණුම් ගිණුම
2 වැටුප් සහ වේතන ගිණුම
3 ගොඩනැගිලි නඩත්තු ගිණුම
4 යන්ත්‍රෝපකරණ ගිණුම

Sandeepa Jayasekera - JMC 32

JMC vLearning "your virtual learning partner"

## 2020 ජනවාරි 1.6

සාම්ප්‍රදායික ගිණුම් වර්ගීකරණය යටතේ මූර්ත ගිණුමක් සඳහා උදාහරණයක් වන්නේ පහත ඒවායින් කවරක් ද?

1 වැටුප් ගිණුම
2 විකුණුම් ගිණුම
3 ණය පොලී ගිණුම
4 යන්ත්‍රෝපකරණ ගිණුම

Sandeepa Jayasekera - JMC 33

## ලෙජර

### පොදු ලෙජර

මූලික පොත්වල එකතුව ද්විත්ව සටහනක් ලෙස වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම් සහ වියදම් ගිණුම්වල වාර්තා කරන්නේ පොදු ලෙජරය තුල වේ. පොදු ලෙජරය තුල පෞද්ගලික නම්වලින් ගිණුම් පවත්වාගෙන නොයයි. ගිණුම්කරණ ක්‍රියාවලියේදී අපට වැදගත් වන්නේ පොදු ලෙජරයයි. ණයගැතියන් සහ ණයහිමියන්ගේ පුද්ගලික නම්වලින් ගිණුම් පොදු ලෙජරය තුල පවත්වාගෙන නොයයි. ඒ වෙනුවට ණයගැති සහ ණයහිමි පාලන ගිණුම් පොදුවේ ණයගැතියන් සහ ණයහිමියන් වෙනුවෙන් පවත්වාගෙන යනු ලබයි.

### උප ලෙජර

- ණයගැති ලෙජර
- ණයහිමි ලෙජර

ව්‍යාපාරයේ එක් එක් ණයගැතියා සහ ණයහිමියා වෙනුවෙන් වෙන වෙනම පෞද්ගලික ගිණුම් තබා ගන්නා ලෙජරය උප ලෙජරය ලෙස හදුන්වයි. මෙම ලෙජරය තුල ණයගැති ණයහිමි පෞද්ගලික ගිණුම්වලට අදාළ තනි සටහන් (සිහිවටන සටහන්) වාර්තා කරයි. මෙම ලෙජරයේ අරමුණ එක් එක් ණයගැතියා සහ ණයහිමියාගේ ශේෂයන් හදුනාගැනීම සහ පාලනය කිරීමයි

Sandeepa Jayasekera - JMC 34

JMC vLearning
"your virtual learning partner"



සෑම ව්‍යාපාරයකම බොහෝ ණයගැතියන් සහ ණය හිමියන් සිටී

එක් එක් ණයගැතියා සහ එක් එක් ණයහිමියන් වෙනුවෙන් පොදු ලෙජරයේ වෙනම ලෙජර් ගිණුමක් පවත්වාගෙන යාම අපහසුය.

Sandeepa Jayasekera - JMC 35

සියළුම ණයගැතියන් සහ සියළුම ණයහිමියන් නියෝජනය කිරීම සඳහා ණයගැති පාලන සහ ණයහිමි පාලන ගිණුම් පොදු ලෙජරයේ පවත්වාගෙන යනු ලැබේ.

එක් එක් ණයගැතියා සහ ණයහිමියා සඳහා, උප ලෙජරයේ වෙනම සිහිවටන ලෙජර් ගිණුමක් පවත්වාගෙන යනු ලැබේ.



Sandeepa Jayasekera - JMC 36

## විකුණුම් ජර්නලය

| දිනය | ඉන්වො. අංකය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|
| X0/3/04 | 556 | සීනා | 400,000 |
| X0/3/05 | 557 | අක්බාර් | 200,000 |
| | | | 600,000 |

රුපියල් 400,000ක් ණයගැති සීනා වෙත ද රුපියල් 200,000ක් ණයගැති අක්බාර් වෙත ණයගැති උප ලෙජරයේ තනි සටහනක් ලෙස හර කරනු ලැබේ.


මූලික පොතේ එකතුව පොදු ලෙජරයේ පාලන ගිණුම්වල සටහන් වේ

**මුළු මුදල රුපියල් 600,000 ණයගැති පාලන ගිණුමට හර විකුණුම් ගිණුමට බැර**



## පාලන ගිණුම්

එක් එක් ණයගැතියා සහ ණයහිමියා සඳහා වෙන වෙනම ලෙජර් ගිණුම් පවත්වාගෙන ගියහොත්, පොදු ලෙජරය කළමනාකරණය කිරීමට අපහසු සහ සංකීර්ණ වනු ඇත. එබැවින්, එක් එක් ණයගැතියා සහ ණයහිමියා වෙනුවෙන් පුද්ගලික ගිණුමක් උප ලෙජරයේ තබා ඇත. මෙම සියළුම ණයගැතියන් ගිණුම් නියෝජනය කිරීම සඳහා වෙනම ණයගැති පාලන ගිණුමක් සහ මෙම සියළුම ණයහිමියන් නියෝජනය කිරීම සඳහා වෙනම ණයහිමි පාලන ගිණුමක් පොදු ලෙජරයේ පවත්වාගෙන යනු ලැබේ. මූලික පොත්වල අදාළ එකතුව ණයගැති සහ ණයහිමි පාලන ගිණුම තුල ද්විත්ව සටහනකින් වාර්තා කරයි




JMC vLearning
"your virtual learning partner"

# පාලන ගිණුම්වල අරමුණු



පොදු ලෙජරය අනවශ්‍ය ලෙස දිගු වීම වළක්වා ගැනීමට



ණයගැතියන්ගේ සහ ණයහිමියන්ගේ වැරදි, අතපසුවීම් සහ වංචා හඳුනා ගැනීම සහ අඩු කිරීම




තොරතුරු ඉක්මනින් හා පහසුවෙන් ලබා ගැනීමට

# පාලන ගිණුම්වල අරමුණු




ශේෂ පිරික්සුම සහ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පහසු වීම



පාලන ගිණුම් සහ ණයගැති/ණයහිමි පෞද්ගලික ගිණුම් පාර්ශව දෙකක් විසින් සකස් කරන බැවින් අවදානම අඩුය.

JMC vLearning
Your virtual learning partner

# ණයගැති පාලන ගිණුම සකස් කිරීම




# 2021 ජනවාරි 1.7

2021 ජනවාරි මාසය සඳහා වෙළඳ ණයගැතියන් සම්බන්ධයෙන් ABC වෙළඳුන්ගේ පොත් වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදි

| | |
|---|---|
| 2021 ජනවාරි 01 වන දිනට වෙළඳ ණයගැතියන්ගේ පාලන ගිණුම් ශේෂය | 200,000 |
| 2021 ජනවාරි 31 වන දිනට වෙළඳ ණයගැතියන්ගේ පාලන ගිණුම් ශේෂය | 225,000 |
| 2021 ජනවාරි මාසය තුළ ණය ගැතියන්ගෙන් ලැබුණු මුදල් | 350,000 |
| 2021 ජනවාරි මාසය සඳහා විකුණුම් ආපසු එවුම් | 25,000 |

ඉහත තොරතුරු මත පදනම්ව, 2021 ජනවාරි මාසය තුළ මුළු විකුණුම්

(1) රු 400,000/- (2) රු 375,000/- (3) රු 350,000/- (4) රු 450,000/-



JMC vLearning "your virtual learning partner"

# 2021 ජූලි 1.20

2021 ජනවාරි මාසය සඳහා වෙළඳ ණයගැතියන් සම්බන්ධයෙන් XYZ වෙළදුන්ගේ පොත් වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදි


| | |
|---|---:|
| 2021 ජනවාරි 01 දිනට ණයගැති ශේෂය | 200,000 |
| දෛනික විකුණුම් පොතේ එකතුව | 225,000 |
| ආපසු එවුම් ජර්නලයේ එකතුව | 350,000 |
| මාසය තුල ණයගැතියන්ගෙන් ලද මුදල | 25,000 |

2021 ජනවාරි 31 දිනට ණයගැති ගිණුමේ ශේෂය ගණනය කරන්න



JMC vLearning "your virtual learning partner"

# ණය හිමියන්ගේ පාලන ගිණුම සකස් කිරීම



# 2020 ජුලි 1.20

2020 මාර්තු මාසය සඳහා චතුර ව්‍යාපාරයේ ගිණුම් පොත් වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදි

| | රු |
|---|---|
| 2020 මාර්තු 01 දිනට ණය හිමියන්ගේ පාලන ගිණුම් ශේෂය | 875,000 |
| මාර්තු මාසය සඳහා ගැනුම් ජර්නලයේ එකතුව | 2,350,000 |
| මාර්තු මාසය සඳහා විකුණුම් ජර්නලයේ එකතුව | 3,450,000 |
| මාර්තු මාසය සඳහා ගැණුම් ආපසු යැවුම් ජර්නලයේ එකතුව | 575,000 |
| මාර්තු මාසය තුළ ණය හිමියන්ට ගෙවීම් | 1,450,000 |

ඉහත තොරතුරු සැලකිල්ලට ගනිමින්,

2020 මාර්තු 31 දිනට ණයහිමියන්ගේ පාලන ගිණුම් ශේෂය ගණනය කරන්න



# 2022 ජනවාරි 1.20

පහත තොරතුරු 2021 මාර්තු මාසය සඳහා අමීන් ව්‍යාපාරයේ පොත්වලින් උපුටා ගන්නා ලදි

| | |
|---|---|
| 2021 මාර්තු 01 දිනට වෙළඳ ණයහිමියන්ගේ ගිණුම් ශේෂය | 475,000 |
| මාසය සඳහා ගැනුම් ජර්නලයේ එකතුව | 1,250,000 |
| මාසය සඳහා ගැනුම් ආපසු යැවුම් ජර්නලයේ එකතුව | 125,000 |
| මාසය තුළ වෙළඳ ණයහිමියන්ට ගෙවීම් | 600,000 |

2021 මාර්තු 31 දිනට වෙළඳ ණයහිමි පාලන ගිණුමේ ශේෂය

# ප්‍රති සටහන්

- එකම පුද්ගලයා හෝ ආයතනය ණයහිමි සහ ණයගැති ශේෂ තුල සිටිය හැකිය
- අදාළ ණයගැති/ණයහිමි සමාගම එකඟතාවය පළ කරන්නේ නම් ප්‍රති සටහනක් තුලින් එම එකිනෙක ශේෂ හිලව් කරගත හැකිය



ණයහිමි පාලන හර
ණයගැති පාලන බැර

| ණයගැතියෙකුගේ බැර ශේෂයක් තිබීමට හේතු | ණයහිමියෙකුගේ හර ශේෂයක් තිබීමට හේතු |
|---|---|
| • වැඩිපුර ගෙවීමක් හේතුවෙන් ණයගැතියාගෙන් ලැබුණු අතිරික්ත මුදල්.<br>• ණයගැති ශේෂය පියවීමෙන් පසු භාණ්ඩ ආපසු ලබා දීම.<br>• ණයගැති ශේෂය පියවීමෙන් පසු වට්ටමක් ලැබීම. | • වැඩිපුර ගෙවීමක් හේතුවෙන්<br>• ණයහිමියෙකුට ගෙවන ලද අතිරික්ත මුදල්.<br>• ණයහිමි ශේෂය පියවීමෙන් පසු භාණ්ඩ ආපසු ලබා දීම.<br>• ණයහිමි ශේෂය පියවීමෙන් පසු වට්ටමක් ලැබීම. |

JIC vLearning
"your virtual learning partner"

## උදාහරණ

සුමනා ලිමිටඩ් හි පහත දැක්වෙන ණයට විකුණුම් සිදු විය

දයාවතීට රු 50,000ක්
සීලවතීට රු 40,000ක්
සිරියාවතීට රු 25,000ක්

පහත සඳහන් පරිදි ණයගැතියන්ගෙන් මුදල් ලැබී ඇත

දයාවතීගෙන් රු 30,000ක්
සීලවතීගෙන් රු 20,000ක්
සිරියාවතීගෙන් රු 20,000ක්

## පොදු ලෙජරය

### ණයගැති පාලන

| | | | |
|---|---|---|---|
| විකුණුම් | 115,000 | මුදල් | 70,000 |
| | | ශේෂය ප/ගෙ | 45,000 |
| | 115,000 | | 115,000 |
| ශේෂය ඉ/ගෙ | 45,000 | | |

### විකුණුම්

| | | | |
|---|---|---|---|
| ලාභාලාභ | 115,000 | ණයගැති පාලන | 115,000 |
| | 115,000 | | 115,000 |

### මුදල්

| | | | |
|---|---|---|---|
| ණයගැති පාලන | 70,000 | ශේෂය ප/ගෙ | 70,000 |
| | 70,000 | | 70,000 |
| ශේෂය ඉ/ගෙ | 70,000 | | |

## පෞද්ගලික ලෙජර - ණයගැති ලෙජරය

**දයාවතී**

| | | | |
|---|---|---|---|
| විකුණුම් | 50,000 | මුදල් | 30,000 |
| | | ශේෂය ප/ගෙ | 20,000 |
| | 50,000 | | 50,000 |
| ශේෂය ඉ/ගෙ | 20,000 | | |

**සිරියාවතී**

| | | | |
|---|---|---|---|
| විකුණුම් | 25,000 | මුදල් | 20,000 |
| | | ශේෂය ප/ගෙ | 5,000 |
| | 25,000 | | 25,000 |
| ශේෂය ඉ/ගෙ | 5,000 | | |

**සීලවතී**

| | | | |
|---|---|---|---|
| විකුණුම් | 40,000 | මුදල් | 20,000 |
| | | ශේෂය ප/ගෙ | 20,000 |
| | 40,000 | | 40,000 |
| ශේෂය ඉ/ගෙ | 20,000 | | |

| | |
|---|---|
| දයාවතී | 20,000 |
| සීලවතී | 20,000 |
| සිරියාවතී | 5,000 |
| ණයගැති ලෙජර එකතුව | 45,000 |
| පොදු ලෙජරයේ ණයගැති පාලන ගිණුම | 45,000 |

ඕනෑම අවස්ථාවක පාලන ගිණුමේ ශේෂය සහ ණයගැති ලෙජර ගිණුම්වල ශේෂ එකතුව සමාන විය යුතු වේ

JMC vLearning
"your virtual learning partner"





## මොකද්ද සැසදුම් ප්‍රකාශයක් කියන්නේ?

ලේඛණ 2ක් අතර වෙනසට හේතු පෙන්වන ප්‍රකාශයකි

## ණයගැති ණයහිමි සැසඳුම් ප්‍රකාශ

- අප පෙර ඉගෙනගත් පරිදි ණයගැති පාලන ගිණුමේ ශේෂය ණයගැති ලෙජරයේ ශේෂ ලැයිස්තුවේ එකතුව සමග සමාන විය යුතුය. එමෙන්ම ණයහිමි පාලන ගිණුමේ ශේෂය ණයහිමි ලෙජරයේ ශේෂ ලැයිස්තුවේ එකතුව සමග සමාන විය යුතුය
- එම ශේෂයන් අසමාන වන්නේ නම් පාලන ගිණුම තුල හෝ උප ලෙජරය තුල වරදක් හෝ අත්හැරීමක් සිදුවී තිබේ
- පාලන ගිණුම් සහ උප ලෙජරයේ ශේෂ ලැයිස්තුව අතර වෙනසට හේතු පෙන්වමින් ශේෂයන් 2 සන්සන්දනය කරමින් පිළියෙල කරන ලියවිල්ල ණයගැති/ණයහිමි සැසදුම් ප්‍රකාශනය ලෙස හදුන්වයි

## ප්‍රශ්න අංක 16

31/8/X9 දින වන විට ෂෙහාන්ගේ ව්‍යාපාරයේ ණයගැති පාලන ගිණුම් ශේෂය රු. 32,000 කි. ණයගැති ලෙජරයේ ශේෂය මෙම ශේෂයට වඩා වෙනස් විය. පහත හේතු පසුව සොයා ගන්නා ලදි

1 විකුණුම් ජර්නලයේ එකතුව රු. 2,000ක් අඩුවෙන් සටහන්ව ඇත
2 ණයගැති සිල්වා විසින් ආපසු එවන ලද රු. 2,000 ක භාණ්ඩ ආපසු එවුම් ජර්නලය තුල නිවැරදිව සටහන්ව තිබුණද ඔහුගේ පුද්ගලික ගිණුමේ එය රු. 4,000ක් ලෙස සටහන්ව ඇත
3 ණයගැතියන්ගෙන් ලද රු. 10,000ක මුදල්, මුදල් පාලන ගිණුමේ නිවැරදිව සටහන් කර ඇති නමුත්, එය ණයගැති පාලන ගිණුමේ සටහන් කර නොමැත. කෙසේ වෙතත්, මෙය ණයගැති ලෙජරයේ නිවැරදිව සටහන් කර ඇත
4 කපා හළ රු. 5,000ක බොල් ණය, ණයගැති ලෙජරය තුල වාර්තා කර නොමැත

අවශ්‍ය වන්නේ
සංශෝධිත ණයගැති පාලන ගිණුම
සංශෝධිත ණයගැති පාලන ගිණුමේ සිට ණයගැති ශේෂ ලැයිස්තුව දක්වා ණයගැති සැසදුම් ප්‍රකාශනය පිළියෙල කරන්න

## ප්‍රශ්න අංක 04

31/8/X9 දිනට ජනිත්ගේ ව්‍යාපාරයේ ණයහිමි ලෙජරයේ ශේෂ ලැයිස්තුවේ එකතුව රු. 28,000 කි. ණයහිමි පාලන ගිණුමේ ශේෂය මෙයට වෙනස් විය. පහත හේතු පසුව සොයා ගන්නා ලදි

1 ණයහිමියන්ට ගෙවූ රු. 5,000ක මුදල, මුදල් පාලන ගිණුමේ නිවැරදිව සටහන් වුවද, ණයහිමි පාලන ගිණුමේ සටහන්ව ඇත්තේ රු. 3,000ක් ලෙසය
2 ගැනුම් ජර්නලය රු. 10,000ක් අඩුවෙන් එකතු වී ඇත
3 ආපසු යැවුම් රු. 2,000ක් ණයහිමි සමන්ගේ ගිණුමේ සටහන්ව නොමැත
4 රු. 4,000ක ලද වට්ටම අමල්ගේ ගිණුමේ සටහන්ව ඇත්තේ රු. 7,000ක් ලෙසය

අවශ්‍ය වන්නේ
ණයහිමි ශේෂ ලැයිස්තුවේ සිට ණයහිමි පාලන ගිණුමේ ශේෂය සඳහා ණයහිමි සැසදුම් ප්‍රකාශය පිළියෙළ කරන්න
සංශෝධිත ණයහිමි පාලන ගිණුම

JMC vLearning "your virtual learning partner"

# ශේෂ පිරික්සුම




JMC Jayasekera Management Centre (Pvt) Ltd

# ලෙජර ගිණුම්වල අවසාන ශේෂය, ශේෂ පිරික්සුමට ගෙන ඒම




ලෙජරය

තොරතුරු සාරාංශ වේ




ශේෂ පිරික්සුම

Sandeepa Jayasekera - JMC

58

JMC vLearning
"your virtual learning partner"



මොකද්ද මේ ශේෂ පිරික්සම කියන්නේ?

Sandeepa Jayasekera - JMC 59

# ශේෂ පිරික්සුම

පෙර අප ඉගෙනගත් පරිදි මූලික පොත්වල එකතුව ලෙජරයට ද්විත්ව සටහනකින් වාර්තා කරයි. ගිණුම් වර්ෂයක් අවසානයේදි ලෙජර ගිණුම් තුලනය කර අවසාන ශේෂ ගණනය කරයි. මෙම අවසාන ශේෂ පෙන්වීමට පිළියෙල කරන ලියවිල්ල ශේෂ පිරික්සුම වේ. ශේෂ පිරික්සුම තුල ලෙජර ගිණුමේ නම සහ අවසාන හර සහ බැර ශේෂයන් දක්වයි.

| Account | Debit | Credit |
|---|---|---|
| Purchases | | |
| Sundry Debtors | | |
| Stock (as on Apr, YYYY) | | |
| Sales | | |
| Cash at Bank | | |
| Machinery | | |
| Discount Received | | |
| Bank Loan | | |
| Bad Debts | | |
| Sundry Creditors | | |
| Carriage Outwards | | |
| Capital | | |
| Provision for Doubtful Debts | | |
| Rent | | |
| Discount Allowed | | |
| **TOTAL =** | | |

JMC vLearning "your virtual learning partner"




# ශේෂ පිරික්සුම

ද්විත්ව සටහන් න්‍යායට අනුව සෑම හර සටහනකටම සමාන වූ බැර සටහනක් වාර්තා කර ඇති බැවින්, ශේෂ පිරික්සුමේ සියළුම හර ශේෂ එකතුව බැර ශේෂ එකතුවට සමාන විය යුතුය. එසේ නොවන්නේ නම් යම් වරදක් තිබෙන බවට හදුනාගත හැකි වේ.

ශේෂ පිරික්සුම තුලින් ලෙජරය තුල ඇති තොරතුරු සාරාංශ වනවා සේම, එය භාවිතා කර මූල්‍ය ප්‍රකාශ පහසුවෙන් පිළියෙල කළ හැකිය.



JMC vLearning
"your virtual learning partner"

# ශේෂ පිරික්සුම සැකසීමේ ක්‍රියාවලිය

| අදියර 01 | අදියර 02 | අදියර 03 |
| --- | --- | --- |
| ලෙජරයේ ගනුදෙනු වාර්තා කිරීම | ලෙජර් ගිණුම් තුලනය කිරීම | ලෙජරයේ අවසාන ශේෂයන් ශේෂ පිරික්සුමට ගෙන ඒම |

- හර පැත්ත වැඩි නම් හර ශේෂයක් ලැබේ
- බැර පැත්ත වැඩි නම් බැර ශේෂයක් ලැබේ

# ශේෂ පිරික්සුමක ආකෘතිය

ABC ව්‍යාපාරයේ
31/3/X1 දිනට ශේෂ පිරික්සුම

| විස්තරය | හර රු. | බැර රු. |
|---|---|---|
| විකුණුම් | | XXX |
| ගැනුම් | XXX | |
| වැටුප් | XXX | |
| ඉඩම් | | XXX |
| එකතුව | XXX | XXX |



JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්න අංක 01

පහත ශේෂයන් ශරුනි ව්‍යාපාරයේ 31/3/X4 දිනට අදාළ වේ එම තොරතුරු තුලින් ශේෂ පිරික්සුම පිළියෙල කරන්න

| ගිණුම | රු |
|---|---|
| බැංකු ණය | 100,000 |
| මුදල් | 35,000 |
| ප්‍රාග්ධනය | 100,000 |
| බදු වියදම | 15,000 |
| ගෙවිය යුතු බදු | 10,000 |
| ණයහිමියෝ | 75,000 |
| ණයගැතියෝ | 200,000 |
| ගැනුම් | 150,000 |
| විකුණුම් | 200,000 |
| පොළී වියදම | 1,000 |
| වැටුප් | 34,000 |
| මෝටර් රථය | 50,000 |

## ප්‍රශ්න අංක 02

ශේන්ගේ ව්‍යාපාරයේ X4/04/01 දිනට පහත ශේෂ උපුටාගෙන ඇත

| | |
|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | 400,000 |
| ගෘහ භාණ්ඩ | 20,000 |
| ණයගැතියෝ | 100,000 |
| මුදල් | 50,000 |
| බැංකු ණය | 200,000 |
| ණයහිමියෝ | 80,000 |

වර්ෂය තුලදි පහත ගනුදෙනු සිදු විය

1. අත්පිට මුදලට කළ ගැනුම් රු. 120,000
2. අත්පිට විකුණුම් රු. 260,000
3. ආරම්භක ණයගැතියන්ගෙන් 10%ක වට්ටම අඩු කිරීමෙන් පසුව මුදල් ලැබී ඇත



4. ආරම්භක ණයහිමි ශේෂයෙන් 5%ක වට්ටම අඩු කිරීමෙන් පසු ශේෂය පියවන ලදි
5. ණයට විකුණුම් රු. 300,000
6. ණයට ගැනුම් රු. 200,000
7. බැංකු ණය වාරිකය රු. 40,000ක් ගෙවන ලදි. වාරිකය තුල ඇතුලත් පොළිය රු. 10,000කි
8. ගැනුම් ආපසු යැවුම් රු. 40,000කි
9. විකුණුම් ආපසු එවුම් රු. 50,000කි
10. පියෙස්ට්‍රා සමාගමෙන් ණයට ගත් ගෘහ භාණ්ඩ රු. 20,000කි
11. වැටුප් වියදම රු. 50,000ක් වූ අතර, ඉන් රු. 40,000ක් පමණක් ගෙවා ඇත
12. විදුලිය වියදම රු. 10,000ක් ගෙවා ඇත
13. ගොඩනැගිල්ල කුළියට දිමෙන් ලද ආදායම රු. 15,000කි

අවශ්‍ය වන්නේ

1 මෙම ගනුදෙනු ලෙජරය තුල වාර්තා කරන්න

2 ලෙජර තුලනය කර ශේෂ පිරික්සුම පිළියෙල කරන්න



JMC vLearning "your virtual learning partner"

# 2021 ජනවාරි ප්‍රශ්න අංක 3

සෑම්, 2020 අප්‍රේල් 01 දින මුදලින් රු.580,000/- ක් ආයෝජනය කරමින් සෑම් ට්‍රේඩර්ස් නම් වූ කේවල ස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

1. 2020 අප්‍රේල් 30 දිනෙන් අවසන් වූ මාසය සඳහා මුදල් පාලන ගිණුමේ (මුදල් පොත) සාරාංශය පහත දැක්වේ.

| | රු. | | රු. |
|---|---:|---|---:|
| මූලික ප්‍රාග්ධන ආයෝජනය | 580,000 | වැටුප් සහ වේතන | 1,375,000 |
| අමතර ප්‍රාග්ධන ආයෝජනය | 1,200,000 | කුලිය | 125,000 |
| මුදලට විකුණුම් | 5,500,000 | වෙළෙඳ ණය හිමියන්ට ගෙවීම් | 2,250,000 |
| වෙළෙඳ ණය ගැතියන්ගෙන් ලැබීම් | 1,900,000 | ලොරි රථයක් මිල දී ගැනීම (2020 අප්‍රේල් 01 දින අත්පත් කරගන්නා ලදි) | 2,400,000 |
| | | මුදලට ගැනුම් | 2,000,000 |
| | | විදුලිය | 45,000 |
| | | ශේෂය ප/ගෙ | 985,000 |
| | 9,180,000 | | 9,180,000 |



2. 2020 අප්‍රේල් 30 වන දිනට ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ පහත සදහන් පරිදි වේ.

| | |
|---|---:|
| වෙළඳ ණයගැතියෝ | 1,400,000 |
| වෙළඳ ණයහිමියෝ | 2,100,000 |
| උපචිත වැටුප් | 25,000 |

3. ලොරි රථය, සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් ක්ෂය කළ යුතුය

4. 2020 අප්‍රේල් 30 දිනට තොග කිසිවක් නොතිබුණි.

ඔබ විසින් කළ යුතු දෑ

2020 අප්‍රේල් 30 දිනට සෑම් ට්‍රේඩර්ස්හි ශේෂ පිරික්සුම පිළියෙළ කරන්න (ලකුණු 10)



JMC vLearning "your virtual learning partner"

# 2021 ජූලි ප්‍රශ්න අංක 2

රුබෙරු විසින් මුදලින් රු.2,500,000/- ක් ආයෝජනය කරමින් සහ රු. 1,500,000/- කට අගය කළ ඔහුගේ පෞද්ගලික මෝටර් රථය ව්‍යාපාරයට මාරු කරමින් 2020 අප්‍රේල් 01 දින කේවල ස්වාමි ව්‍යාපාරයක් වන රුබෙරු ට්‍රේඩර්ස්, ආරම්භ කරන ලදි.

1. 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් පාලන ගිණුමේ (මුදල් පොත) සාරාංශය පහත දැක්වේ.

| | හර (රු.) | | බැර (රු.) |
|---|---|---|---|
| මූලික ප්‍රාග්ධන ආයෝජනය | 2,500,000 | වෙළෙඳ ණය හිමියන්ට කළ ගෙවීම් | 1,300,000 |
| වෙළෙඳ ණය ගැතියන්ගෙන් ලැබීම | 1,800,000 | අත්පිට ගැනුම් | 600,000 |
| අත්පිට විකුණුම් | 900,000 | විදුලිය | 69,000 |
| | | වැටුප් සහ වේතන | 93,000 |
| | | ජලය | 18,000 |
| | | ශේෂය ප/ගෙ | 3,120,000 |
| | 5,200,000 | | 5,200,000 |
| ශේෂය ඉ/ගෙ | 3,120,000 | | |



2. 2021 මාර්තු 31 වන දිනට ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ පහත සදහන් පරිදි වේ.

| | |
|---|---|
| වෙළඳ ණයගැතියෝ | 250,000 |
| වෙළඳ ණයහිමියෝ | 390,000 |
| උපචිත විදුලිය බිල්පත් | 11,000 |
| කලින් ගෙවූ ජල බිල්පත් | 2,000 |

3. මෝටර් රථය, සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් ක්ෂය කළ යුතුය

4. 2021 මාර්තු 31 දිනට තොග කිසිවක් නොතිබුණි.

ඔබ විසින් කළ යුතු දෑ

2021 මාර්තු 31 දිනට රුබෙරු ට්‍රේඩර්ස්හි ශේෂ පිරික්සුම පිළියෙළ කරන්න (ලකුණු 10)



JMC vLearning "your virtual learning partner"

# 2022 ජනවාරි ප්‍රශ්න අංක 2

සෑම්, 2020 අප්‍රේල් 01 දින මුදලින් රු.3,000,000/- ක් ආයෝජනය කරමින් සෑම් ට්‍රේඩර්ස් නම් වූ කේවල ස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

1. 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් පාලන ගිණුමේ (මුදල් පොත) සාරාංශය පහත දැක්වේ.

| ලැබීම් | හර (රු.) | ගෙවීම් | බැර (රු.) |
|---|---|---|---|
| මූලික ප්‍රාග්ධන ආයෝජනය | 3,000,000 | වෙළඳ ණයහිමියන්ට කළ ගෙවීම් | 2,200,000 |
| අත්පිට විකුණුම් | 2,000,000 | අත්පිට ගැනුම් | 900,000 |
| වෙළඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 3,600,000 | සුළු මුදල් | 25,000 |
| | | විදුලිය | 25,000 |
| | | වැටුප් සහ වේතන | 1,000,000 |
| | | කාර්යාල කුලිය | 350,000 |
| | | මෝටර් වාහනයක් මිලට ගැනීම (2020 අප්‍රේල් 01 දින අත්පත් කරගන්නා ලදි) | 1,500,000 |
| | | ශේෂය ප/ගෙ | 2,600,000 |
| | 8,600,000 | | 8,600,000 |



2. 2021 මාර්තු 31 වන දිනට ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| වෙළඳ ණයගැතියෝ | 750,000 |
| වෙළඳ ණයහිමියෝ | 440,000 |
| ගෙවිය යුතු විදුලි බිල්පත් | 6,500 |

3. මෝටර් වාහන, සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව 25% බැගින් ක්ෂය කළ යුතුය

4. සුළු මුදල් ගනුදෙනු පහත සඳහන් පරිදි විය

| | | | |
|---|---|---|---|
| මුදල් පාලන ගිණුම | 25,000 | මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය | 4,500 |
| | | ගමන් වියදම් | 8,000 |
| | | කාර්යාල නඩත්තු | 6,500 |
| | | ශේෂය ප/ගෙ | 6,000 |
| | 25,000 | | 25,000 |

ඔබ විසින් කළ යුතු දෑ

2021 මාර්තු 31 දිනට සෑම් ට්‍රේඩර්ස්හි ශේෂ පිරික්සුම පිළියෙළ කරන්න (ලකුණු 10)



JMC vLearning your virtual learning partner

# 2022 ජූලි ප්‍රශ්න අංක 4

දුස්රා ට්‍රේඩර්ස්, මුරලි විසින් 2021 අප්‍රේල් 01 දින මුදලින් රු.7,000,000/- ක් ආරම්භක ප්‍රාග්ධනය ආයෝජනය කරමින් ආරම්භ කරන ලද කේවල ස්වාමි ව්‍යාපාරයකි. පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

1. 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් පාලන ගිණුමේ (මුදල් පොත) සාරාංශය පහත දැක්වේ.

| ලැබීම් | හර (රු.) | ගෙවීම් | බැර (රු.) |
|---|---|---|---|
| මූලික ප්‍රාග්ධන ආයෝජනය | 7,000,000 | වෙළඳ ණයහිමියන්ට කළ ගෙවීම් | 1,800,000 |
| අත්පිට විකුණුම් | 3,200,000 | අත්පිට ගැනුම් | 1,200,000 |
| වෙළඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 2,400,000 | විදුලිය සහ ජලය | 300,000 |
| | | කාර්යාල කුළිය | 275,000 |
| | | යන්ත්‍රයක් මිලට ගැනීම (2021 ඔක්තෝම්බර් 01 දින මිලට ගන්නා ලදි) | 2,500,000 |
| | | වැටුප් සහ වේතන | 2,100,000 |
| | | ශේෂය ප/ගෙ | 4,425,000 |
| | 12,600,000 | | 12,600,000 |

Sandeepa Jayasekera - JMC

2. 2022 මාර්තු 31 වන දිනට ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| වෙළඳ ණයගැතියෝ | 950,000 |
| වෙළඳ ණයහිමියෝ | 940,000 |
| ගෙවිය යුතු විදුලි සහ ජල බිල්පත් | 29,000 |

3. යන්ත්‍ර, සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් ක්ෂය කළ යුතුය

4. 2022 මාර්තු 31 දිනට තොග කිසිවක් නොතිබුණි.

ඔබ විසින් කළ යුතු දෑ:
2022 මාර්තු 31 දිනට දුස්රා ට්‍රේඩර්ස්හි ශේෂ පිරික්සුම පිළියෙළ කරන්න (ලකුණු 10)



JMC vLearning "your virtual learning partner"

# 2023 ජනවාරි ප්‍රශ්න අංක 2

අනීෂ් ට්‍රේඩර්ස් යනු 2021 අප්‍රේල් 01 දින රු.5,000,000/- ක් මුදලින් ආයෝජනය කරමින් අනීෂ් විසින් ආරම්භ කරන ලද කේවල ස්වාමි ව්‍යාපාරයකි. පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

1. 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් පාලන ගිණුමේ (මුදල් පොත) සාරාංශය පහත දැක්වේ.

| ලැබීම් | හර (රු.) | ගෙවීම් | බැර (රු.) |
|---|---|---|---|
| මූලික ප්‍රාග්ධන ආයෝජනය | 5,000,000 | අත්පිට ගැනුම් | 2,100,000 |
| අත්පිට විකුණුම් | 3,200,000 | වෙළඳ ණයහිමියන්ට කළ ගෙවීම් | 2,150,000 |
| වෙළඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 1,400,000 | වැටුප් හා වේතන | 1 ,300,000 |
| | | කාර්යාල කුළිය | 600,000 |
| | | යන්ත්‍රයක් මිලට ගැනීම (2022 ජනවාරි 01 දින මිලට ගන්නා ලද) | 3,000,000 |
| | | විදුලිය | 100,000 |
| | | ශේෂය ප/ගෙ | 350,000 |
| | 9,600,000 | | 9,600,000 |

Sandeepa Jayasekera - JMC

2. 2022 මාර්තු 31 වන දිනට ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ පහත සදහන් පරිදි වේ.

| | |
|---|---|
| වෙළඳ ණයගැතියෝ | 1,950,000 |
| වෙළඳ ණයහිමියෝ | 740,000 |
| ගෙවිය යුතු විදුලි බිල්පත් | 25,000 |
| කලින් කළ ගොඩනැගිලි කුළී වියදම | 100,000 |

3. යන්ත්‍ර, සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව 25% බැගින් ක්ෂය කළ යුතුය

4. 2022 මාර්තු 31 දිනට තොග කිසිවක් නොතිබුණි.

ඔබ විසින් කළ යුතු දෑ:
2022 මාර්තු 31 දිනට අනීෂ් ට්‍රේඩර්ස් හි ශේෂ පිරික්සුම පිළියෙළ කරන්න (ලකුණු 10)



JMC vLearning "your virtual learning partner"

# 2023 ජූලි ප්‍රශ්න අංක 4

ලසන්ත ට්‍රේඩර්ස් යනු 2022 අප්‍රේල් 01 දින මුදලින් රු.2,800,000/- ක් අයෝජනය කරමින් ලසන්ත විසින් ආරම්භ කළ කේවලස්වාමි ව්‍යාපාරයකි. පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

1. 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් පාලන ගිණුමේ (මුදල් පොත) සාරාංශය පහත දැක්වේ.

| ලැබීම් | හර (රු.) | ගෙවීම් | බැර (රු.) |
|---|---|---|---|
| මූලික ප්‍රාග්ධන ආයෝජනය | 2,800,000 | අත්පිට මුදලට ගැනුම් | 800,000 |
| අත්පිට විකුණුම් | 4,200,000 | වෙළඳ ණයහිමියන්ට කළ ගෙවීම් | 3,800,000 |
| වෙළඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 1,800,000 | විදුලිය | 185,000 |
| | | සුළු මුදල් පොතට මාරු කිරීම | 120,000 |
| | | කාර්යාල උපකරණ මිලදී ගැනීම (2023 ජනවාරි 01 දින මිලට ගන්නා ලදී) | 500,000 |
| | | වැටුප් සහ වේතන | 1,800,000 |
| | | ශේෂය ප/ගෙ | 1,595,000 |
| | 8,800,000 | | 8,800,000 |

Sandeepa Jayasekera - JMC

2. 2023 මාර්තු 31 වන දිනට ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ පහත සදහන් පරිදි වේ.

| | |
|---|---|
| වෙළඳ ණයගැතියෝ | 1,450,000 |
| වෙළඳ ණයහිමියෝ | 1,200,000 |
| ගෙවිය යුතු විදුලි බිල්පත් | 19,000 |

3. කාර්යාල උපකරණ, සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් ක්ෂය කළ යුතුය

4. පහත සඳහන් වියදම් සුළු මුදල්වලින් ගෙවා ඇත.

| | |
|---|---|
| සේවක සුභසාධක | රු. 15,000/- |
| ගමන් වියදම් | රු. 50,000/- |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | රු. 35,000/- |

ඔබ විසින් කළ යුතු දෑ

2023 මාර්තු 31 දිනට ලසන්ත ට්‍රේඩර්ස් හි ශේෂ පිරික්සුම පිළියෙළ කරන්න (ලකුණු 10)

JMC vLearning "your virtual learning partner"

# 2024 ජුලි ප්‍රශ්න අංක 4

**රෝහිත්**, කේවලස්වාමි ව්‍යාපාරයක් වන **රෝහිත් හාඩ්වෙයාර්** 2023 අප්‍රේල් 01 දින මුදලින් රු. 2,250,000/-ක් අයෝජනය කරමින් ආරම්භ කරන ලදි. පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත

1. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) සාරාංශය පහත දැක්වේ.

| **ලැබීම්** | **හර (රු.)** | **ගෙවීම්** | **බැර (රු.)** |
|---|---|---|---|
| මූලික ප්‍රාග්ධන ආයෝජනය | 2,250,000 | අත්පිට ගැනුම් | 850,000 |
| අත්පිට විකුණුම් | 5,200,000 | වෙළඳ ණයහිමියන්ට ගෙවීම් | 3,750,000 |
| වෙළඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 1,250,000 | වැටුප් සහ වේතන | 950,000 |
| | | ගැනිලි | 100,000 |
| | | සුළු මුදල්වලට මාරු කළ මුදල | 60,000 |
| | | යාන්ත්‍රය (2024 ජනවාරි 01 දින මිලදී ගත්) | 1,000,000 |
| | | කුළිය | 900,000 |
| | | විදුලිය | 150,000 |
| | | ශේෂය ප/ගෙ | 940,000 |
| | <u>8,700,000</u> | | <u>8,700,000</u> |

Sandeepa Jayasekera - JMC

JMC vLearning your virtual learning partner

2. 2024 මාර්තු 31 වන දිනට ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| වෙළඳ ණයගැතියෝ | 1,600,000 |
| වෙළඳ ණයහිමියෝ | 1,100,000 |
| ගෙවිය යුතු වැටුප් | 80,000 |

3. යන්ත්‍ර, සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් ක්ෂය කළ යුතුය

4. පහත සඳහන් වියදම් සුළු මුදල්වලින් ගෙවා ඇත.

| | |
|---|---|
| ජල බිල්පත් | රු. 12,000/- |
| ලිපි ද්‍රව්‍ය | රු. 8,000/- |
| ගමන් වියදම් සහ ප්‍රවාහන | රු. 25,000/- |

5. 2024 අප්‍රේල් සිට 2024 ජුනි දක්වා කාලපරිච්ඡේදය සඳහා ගෙවන ලද රු. 180,000/- ක කුළි අත්තිකාරමක්, කුළී ගෙවීම් තුළ ඇතුළත් වේ

ඔබ විසින් කළ යුතු දෑ:

2024 මාර්තු 31 දිනට **රෝහිත් හාඩ්වේයාර් හි** ශේෂ පිරික්සුම පිළියෙළ කරන්න (ලකුණු 10)

80

# 2024 ජනවාරි ප්‍රශ්න අංක 2

**රවී** විසින් 2022 අප්‍රේල් 01 දින ආරම්භක ප්‍රාග්ධනය වශයෙන් මුදලින් රු.4,850,000/- ක් ආයෝජනය කරමින් **රවී සුපර්** නමින් කේවල ස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

1. 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් පාලන ගිණුමේ (මුදල් පොත) සාරාංශය පහත දැක්වේ.

| **ලැබීම්** | **හර (රු.)** | **ගෙවීම්** | **බැර (රු.)** |
|---|---|---|---|
| ආරම්භක ප්‍රාග්ධන ආයෝජනය | 4,850,000 | අත්පිට ගැනුම් | 1,850,000 |
| අත්පිට විකුණුම් | 3,200,000 | වෙළඳ ණයහිමියන්ට ගෙවීම් | 2,900,000 |
| වෙළඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 2,825,000 | විදුලිය හා ජලය | 255,000 |
| | | වැටුප් සහ වේතන | 1,200,000 |
| | | සුළු මුදල්වලට මාරු කළ මුදල | 100,000 |
| | | බෙදාහැරීමේ වෑන් රථය (2022 ඔක්තෝම්බර් 01 දින මිලදී ගන්නා ලදි.) | 3,000,000 |
| | | ශේෂය ප/ගෙ | 1,570,000 |
| | 10,875,000 | | 10,875,000 |

Sandeepa Jayasekera - JMC

2. 2023 මාර්තු 31 වන දිනට ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| වෙළඳ ණයගැතියෝ | 2,400,000 |
| වෙළඳ ණයහිමියෝ | 2,100,000 |
| ගෙවිය යුතු වැටුප් | 10,000 |

3. මෝටර් වාහන, සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව 25% බැගින් ක්ෂය කළ යුතුය

4. පහත සඳහන් වියදම් සුළු මුදල්වලින් ගෙවා ඇත.

| | |
|---|---|
| කාර්යාල වියදම් | රු. 15,000/- |
| ගමන් වියදම් | රු. 12,000/- |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | රු. 25,000/- |

ඔබ විසින් කළ යුතු දෑ

2023 මාර්තු 31 දිනට **රවී සුපර් හි** ශේෂ පිරික්සුම පිළියෙළ කරන්න (ලකුණු 10)


JMC vLearning "your virtual learning partner"








JMC vLearning
"your virtual learning partner"




ගිණුම්කරණ ක්‍රියාවලියේදී සිදුවන අතපසුවීම්, වැරදි සහ වංචාවන් ගිණුම්කරණ වැරදි ලෙස හදුන්වයි. මෙම වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශ නිවැරදි නොවිය හැකිය.
ව්‍යාපාරයක් කෙරේ ඇල්මක් දක්වන පාර්ශව වැරදි තොරතුරු භාවිතා කළ විට ගන්නා තීරණද වැරදිමට හැකි වේ. එබැවින් ගිණුම්කරණ වැරදි ඇත්නම් ඒවා හදුනාගෙන නිවැරදි කළ යුතුය




Sandeepa Jayasekera - JMC 86

JMC vLearning "Your virtual learning partner"

## ගිණුම්කරණ වරදක් විය හැකි අවස්ථා



ගනුදෙනු මූලික පොත්වල හෝ ලෙජර තුල වාර්තා කරන විට



මූලික පොත්වල එකතුව ගන්නා විට හෝ ලෙජර තුලනය කරන විට



මූලික පොත්වල එකතුව ලෙජරයට මාරු කරන විට




ශේෂ පිරික්සුම පිළියෙල කරන විට


JMC vLearning
"your virtual learning partner"


## 2024 ජූලි 1.16

**1.16 ගිණුම්කරණ දෝෂ (වැරදි) සඳහා හේතු දෙකක් (02) ලැයිස්තු ගත කරන්න.**


ගිණුම්කරණ වරදක් ඇති වීමට බල පෑ හැකි හේතු
නොසැළකිලිමත් කම
දැනුම නොමැතිකම
අමතකවීම් සහ මගහැරීම්
වංචාවක් කිරීමේ අදහසින් කරන වැරදි
සේවකයින්ගේ අදක්ෂ මානසිකත්වය
Sandeepa Jayasekera - JMC
89


ගිණුම්කරණ වැරදි ඇතිවීම වළක්වා ගැනීමට කළ හැකි දෑ
Auditor
සමාලෝචනය සහ අධීක්ෂණය
අනුමත කිරීම් තුලින් පාලනය කිරීම
අභ්‍යන්තර සහ බාහිර විගණනය
දැනුම වැඩිකිරීම සඳහා පුහුණු සහ සංවර්ධන වැඩමුළු
Sandeepa Jayasekera - JMC
90


අකරණ දෝෂ
(අත්හැරීම් දෝෂ)
කරණ දෝෂ
මූලධර්ම දෝෂ
ගිණුම්කරණ
වැරදි වර්ග
ලිපි දෝෂ
හිලව් දෝෂ
ද්වීගණන දෝෂ



ගිණුම්කරණ වැරදි වර්ගීකරණය
ශේෂ පිරික්සුමෙන් අනාවරණය වන වැරදි
ශේෂ පිරික්සුමෙන් අනාවරණය නොවන වැරදි
වෙනස අවිනිශ්චිත ගිණුමක වාර්තා කරයි
නිවැරදි කිරීම් සටහන් මගින් නිවැරදි කෙරේ
අධීක්ෂණ සහ පාලන ක්‍රියාවලි තුලින්, සැසදුම් ප්‍රකාශ තුලින් හඳුනාගැනේ
එක් සටහනක් අත්හැරීම මත ඇතිවන අකරණ දෝෂ
එක් සටහනක් අඩි හෝ අවතක්සේරු වීම මත ඇතිවන කරණ දෝෂ
එක් ගිණුමක පමණක් ද්වීගණනය වීම මත ඇතිවන ද්වීගණන දෝෂ
ආදායමක් වියදමක් ලෙස සටහන්වීම මත ඇතිවන ලිපි දෝෂ
සම්පූර්ණ සටහනම අත්හැරීම මත ඇතිවන අකරණ දෝෂ
සම්පූර්ණ සටහනම අධි/අවතක්සේරු වීමෙන් ඇතිවන කරණ දෝෂ
සම්පූර්ණ සටහනම ද්වීගණනය වීම මත ඇතිවන ද්වීගණන දෝෂ
ලිපි දෝෂ
මූලධර්ම දෝෂ
හිලව් දෝෂ

- ගිණුම්කරණ ක්‍රියාවලියේදී මිනිසුන් සම්බන්ධ වීම නිසා වැරදි ඇතිවීම සාමාන්‍ය තත්වයකි
- ඉහත අප හඳුනාගත් සමහර ගිණුම්කරණ වැරදි, ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේදී එය තුලනය නොවීම මත හඳුනාගත හැකිය. එනම් ද්විත්ව සටහනේ ගැටළුවක් පවතින දෝෂ, ශේෂ පිරික්සුම තුලින් හඳුනාගත හැකිය. ශේෂ පිරික්සුම තුලනය නොවන අවස්ථාවන්වල එම වෙනස තාවකාලිකව අවිනිශ්චිත ගිණුම නම් ගිණුමක තබා තිබේ.
- නමුත් සමහර ගිණුම්කරන වැරදි ශේෂ පිරික්සුමෙන් හඳුනාගත නොහැකිය. එනම් ද්විත්ව සටහනේ හර ශේෂය සහ බැර ශේෂය සමාන වුවද ගිණුම්කරණ වැරදි තිබිය හැකිය.
- ශේෂ පිරික්සුමෙන් හඳුනාගත හැකි සහ නොහැකි සියළුම වැරදි නිවැරදි කළ යුතුවේ. එසේ නිවැරදි කිරීමෙන් පසු අවිනිශ්චිත ගිණුම අහෝසි වී යයි



# අවිනිශ්චිත ගිණුම


- ගිණුම්කරණ වැරදි හේතුවෙන් ශේෂ පිරික්සුම තුලනය නොවන අවස්ථාවක එම වෙනස අවිනිශ්චිත ගිණුම නම් තාවකාලික ගිණුමේ සටහන් කරනු ලබයි.
- එසේ අවිනිශ්චිත ගිණුමේ සටහන් කර තාවකාලිකව ශේෂ පිරික්සුම තුලනය කරයි
- ගිණුම්කරණ වැරදි නිවැරදි කළ පසු අවිනිශ්චිත ගිණුම අහෝසි වී යයි




94

JMC vLearning
your virtual learning partner

# අවිනිශ්චිත ගිණුම




95

# ගිණුම්කරණ වැරදි

| වර්ගය | විස්තරය | උදාහරණ | ශේෂ පිරික්සුමෙන් හඳුනාගත හැකිද? | අවිනිශ්චිත ගිණුමක් අවශ්‍ය වේද? |
|---|---|---|---|---|
| අකරණ දෝෂ (ඇත්හැරීම් දෝෂ) | ගනුදෙනුවේ සම්පූර්ණ ද්විත්ව සටහනම හෝ එක් සටහනක් වාර්තා කිරීම මගහැරී තිබීම | • බැංකු ගාස්තු රු. 500 සම්පූර්ණයෙන්ම ලෙජරයෙන් මගහැරී තිබීම | නැත | නැත |
| | | • ණයට විකුණුම් රු. 10,000 විකුණුම් ගිණුමේ වාර්තා කර තිබුණද එය ණයගැති ගිණුමෙන් මගහැරී තිබුණි | ඔව් | ඔව් |

MC vLearning
your virtual learning partner

## ගිණුම්කරණ වැරදි

| වර්ගය | විස්තරය | උදාහරණ | ශේෂ පිරික්සුමෙන් හදුනාගත හැකිද? | අවිනිශ්චිත ගිණුමක් අවශ්‍ය වේද? |
|---|---|---|---|---|
| කරණ දෝෂ | ගනුදෙනුවක වටිනාකම මූලික පොත්වල හෝ ලෙජරය තුල අධිතක්සේරු වීම (වැඩියෙන් සටහන් වීම) හෝ අවතක්සේරු වීම (අඩුවෙන් සටහන් වීම). මෙම අධි හෝ අවතක්සේරු වීම සම්පූර්ණ ද්විත්ව සටහනම හෝ එක් සටහනක් විය හැකිය. | • මුදලට ගැනුම් රු. 25,000 රු. 2,500ක් ලෙස මුදල් ගිණුමේ සහ ගැනුම් ගිණුම තුල සටහන්ව තිබුණි<br>• රු. 8,000ක උපකරණ මිලදී ගැනීම මුදල් ගිණුමේ නිවැරදිව සටහන් වුවද එය උපකරණ ගිණුමේ සටහන්ව ඇත්තේ රු. 80,000ක් ලෙසය | නැත<br>ඔව් | නැත<br>ඔව් |

JMC vLearning "your virtual learning partner"

## 2024 ජනවාරි 1.15

පහත ප්‍රකාශය සත්‍ය හෝ අසත්‍යදැයි දක්වන්න.

1.15 කරණ දෝෂ/ඌණතා දෝෂ (errors of commission) යනු ගනුදෙනුවක් සම්පූර්ණයෙන් වාර්තා නොකිරීම හෝ ද්විත්ව සටහනේ එක් සටහනක් පමණක් වාර්තා කිරීමයි.

## ගිණුම්කරණ වැරදි

| වර්ගය | විස්තරය | උදාහරණ | ශේෂ පිරික්සුමෙන් හදුනාගත හැකිද? | අවිනිශ්චිත ගිණුමක් අවශ්‍ය වේද? |
|---|---|---|---|---|
| මූලධර්ම දෝෂ | සම්මත ගිණුම්කරණ මූලධර්ම සහ සංකල්පයන්ට පටහැනිව ගනුදෙනු වාර්තා කිරීම මත ඇතිවන දෝෂ. | • වාහන නඩත්තුව සඳහා දරණ ලද රු. 50,000ක මුදල වාහන ගිණුමට හර කර තිබුණි | නැත | නැත |
| | | • අයිතිකරු විසින් මුදලින් කළ ගැනිලි විකුණුම් ගිණුමට හර කර තිබුණි | නැත | නැත |

## ගිණුම්කරණ වැරදි

| වර්ගය | විස්තරය | උදාහරණ | ශේෂ පිරික්සුමෙන් හදුනාගත හැකිද? | අවිනිශ්චිත ගිණුමක් අවශ්‍ය වේද? |
|---|---|---|---|---|
| ද්වීගණන දෝෂ | එකම ගනුදෙනුව කිහිපවතාවක් මූලික පොත් තුල හෝ ලෙජරය තුල වාර්තා කර තිබීම. | • කමල්ට කළ රු. 20,000ක ණයට විකුණුම, විකුණුම් ජර්නලය තුල දෙවතාවක් සටහන්ව තිබුණි | නැත | නැත |
| | | • ගෙවූ වැටුප රු. 50,000 වැටුප් ගිණුම තුල දෙවතාවක් සටහන්ව තිබුණි. මෙය මුදල් පොතේ නිවැරදිව සටහන් වී තිබුණි | ඔව් | ඔව් |

## ගිණුම්කරණ වැරදි

| වර්ගය | විස්තරය | උදාහරණ | ශේෂ පිරික්සුමෙන් හදුනාගත හැකිද? | අවිනිශ්චිත ගිණුමක් අවශ්‍ය වේද? |
|---|---|---|---|---|
| මුලධර්ම දෝෂ | සම්මත ගිණුම්කරණ මුලධර්ම සහ සංකල්පයන්ට පටහැනිව ගනුදෙනු වාර්තා කිරීම මත ඇතිවන දෝෂ. | • වාහන නඩත්තුව සඳහා දරණ ලද රු. 50,000ක මුදල වාහන ගිණුමට හර කර තිබුණි<br>• අයිතිකරු විසින් මුදලින් කළ ගැනිලි රු. 10,000 විකුණුම් ගිණුමට හර කර තිබුණි | නැත<br>නැත | නැත<br>නැත |

## ගිණුම්කරණ වැරදි

| වර්ගය | විස්තරය | උදාහරණ | ශේෂ පිරික්සුමෙන් හදුනාගත හැකිද? | අවිනිශ්චිත ගිණුමක් අවශ්‍ය වේද? |
|---|---|---|---|---|
| හිලව් දෝෂ | එක් ගිණුම්කරණ වරදක බලපෑම තවත් වරදකින් හෝ වැරදි කිහිපයකින් හිලව් වී යන (ආවරණය වී ඇති) දෝෂ. | • ණයගැතියන්ගෙන් ලද මුදල් රු. 2,000 මුදල් ගිණුමේ රු. 20,000ක් ලෙස සටහන්ව තිබූ අතර, විකුණුම් ගිණුම රු. 18,000කින් අධිතක්සේරු වී ඇත<br>• විදුලිය ගිණුම රු. 2,000ක් අඩුවෙන් සටහන්ව ඇති අතර බැංකු ණය වගකීම රු. 2,000ක් අඩුවෙන් සටහන්ව ඇත | නැත<br>නැත | නැත<br>නැත |

## ගිණුම්කරණ වැරදි

| වර්ගය | විස්තරය | උදාහරණ | ශේෂ පිරික්සුමෙන් හදුනාගත හැකිද? | අවිනිශ්චිත ගිණුමක් අවශ්‍ය වේද? |
|---|---|---|---|---|
| ලිපි දෝෂ | ගනුදෙනුවක් සමාන එහෙත් වැරදි ගිණුමක වාර්තා කිරීම මත ඇතිවන දෝෂ | • ගෙවූ දුරකතන වියදම රු. 10,000, විදුලිය වියදම් ගිණුමේ සටහන්ව තිබුණි | නැත | නැත |
| | | • පොළී ආදායම රු. 5,000 පොළී වියදම් ගිණුමේ හරට සටහන් කර තිබුණි. මෙය මුදල් ගිණුමේ නිවැරදිව සටහන් කර ඇත | ඔව් | ඔව් |
| | | | | |

## වැරදි නිවැරදි කිරීමේ පියවර


| | |
|---|---|
| පියවර අංක 01 | |
| පියවර අංක 02 | |
| පියවර අංක 03 | |
| පියවර අංක 04 | |




JMC vLearning
"your virtual learning partner"

# පොදු ජර්නලය තුල නිවැරදි කිරීම් සටහන යොදනු ලැබේ

| දිනය | විස්තරය | හර රු | බැර රු |
|---|---|---|---|
| | හර වන ගිණුමේ නම | XXX | |
| | බැර වන ගිණුමේ නම | | XXX |
| | (සංලක්ෂයය - ගනුදෙනුව පිළිබඳ කෙටි විස්තරයක්) | | |



# 2021 ජනවාරි ප්‍රශ්න අංක 2

සදුන්, රජරට ස්ටෝස්හි ගිණුම් විධායකයෙකු වේ. 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශන පිළියෙල කරන විටද ශේෂ පිරික්සුම එකඟ නොවූ අතර, වෙනස වූ රු.334,000/- අවිනිශ්චිත ගිණුමකට හර කරන ලදි.

කෙසේ වෙතත්, පහත සඳහන් වැරදි පසුව හදුනාගන්නා ලදි:

(1) නැවත විකිණීම සඳහා රු.75,000/- ක් වටිනා අයිතම වෙළෙඳ ණයහිමියෙකුගෙන් මිලට ගැනීම්, වෙළෙඳ ණයහිමියන්ගේ ගිණුම සහ ගැනුම් ගිණුම් යන ගිණුම් දෙකෙහිම වැරදිමකින් දෙවරක් සටහන් කර තිබුණි.

(2) රු.125,000/- ක් වටිනා කාර්යාල උපකරණයක් මිලට ගැනීම, කාර්යාල නඩත්තු වියදම් ගිණුමට හර කර තිබුණි. කෙසේ වෙතත්, එය මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි.

(3) ගොඩනැගිල්ලේ අයිතිකරුට ගෙවූ 2020 මාර්තු මාසය සඳහා වන රු.76,500/- ක කුලිය, නිවැරදිව මුදල් පොතට බැර කර තිබුණ ද, ඊට අදාල හර සටහන අදාල ලෙජර් ගිණුමේ වාර්තා කර නොතිබුණි.

(4) 2020 මාර්තු මාසය සඳහා ගෙවූ රු.475,000/- ක වැටුප්, වැටුප් ගිණුමේ රු.47,500/- ක් ලෙස සටහන් කර තිබුණි. කෙසේ වෙතත්, එය නිවැරදිව මුදල් පොතේ සටහන් කර තිබුණි.

(5) රු.100,000/- ක අත්පිට මුදලට විකුණුම්, විකුණුම් ගිණුමේ සටහන් කර නොතිබුණි. කෙසේ නමුත්, එය මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි.

(6) ස්ථාවර තැන්පතුවක් මත ලැබූ රු.35,000/- පොලී ආදායමට වැරදිමකින් පොළී වියදම් ගිණුමට හර කර තිබෙන නමුත් එය මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි.

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ පිළියෙළ කරන්න:

(i) ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්. (ලකුණු 07)

(ii) අවිනිශ්චිත ගිණුම (ලකුණු 03)

(ලකුණු 10)

## 2021 පුලි ප්‍රශ්න අංක 5

RT ට්‍රේඩර්ස් විදුලි උපකරණ විකිණීමේ ව්‍යාපාරයක නිරතව සිටියි. 2021 මාර්තු 31 දිනට RT ට්‍රේඩර්ස්හි ශේෂ පිරික්සුම එකඟ නොවූ අතර, රු.31,000/- ක වෙනසක් හදුනාගන්නා ලදි. එම වෙනස අවිනිශචිත ගිණුමකට බැර කරමින් කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදි.

පහත සඳහන් වැරදි පසුව හදුනාගන්නා ලදි.

(1) කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා 2021 මාර්තු 01 දින මිලට ගත් රු.150,000/- ක කාර්යාල උපකරණයක්, කාර්යාල උපකරණ නඩත්තු ගිණුමේ වාර්තා කර තිබුණි. කාර්යාල උපකරණ, වාර්ෂිකව 20% බැගින් සරල මාර්ග ක්‍රමයට, පිරිවැය මත ක්ෂය කරනු ලබයි.

(2) රු 150,000/- කුලී වියදම්, කුලී වියදම් ගිණුමට හර කර නොතිබුණි. කෙසේ නමුත් මෙහි බැර සටහන නිවැරදිව අදාල ලෙජර් ගිණුමේ සටහන් කර තිබුණි

(3) රු.190,000/- ක අත්පිට ගැනුම්, ගැනුම් ගිණුමට දෙවරක් හර කර තිබුණි. කෙසේ වෙතත්, මෙය මුදල් පොතේ නිවැරදිව වාර්තා කර තිබුණි.

(4) ව්‍යාපාරයේ අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික පරිහරණය සඳහා ව්‍යාපාරයෙන් ලබා ගත් භාණ්ඩවල පිරිවැය රු.98,000/- ක් විය. මෙය රු.89,000/- ක් ලෙස ගැනිලි ගිණුමට හරකර තිබුණු අතර, අදාල බැර සටහන නිවැරදිව සටහන් කර තිබුණි.

(5) දෛනික ගැනුම් පොතේ එකතුව, රු.50,000/- කින් වැඩිපුර සටහන් වී තිබුණි.

(6) ස්ථාවර තැන්පතුවක් මත ලැබුණු රු.2,500/- ක පොලිය, සම්පූර්ණයෙන්ම ගිණුම් පොත්වලින් මගහැරී ඇත.

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ පිළියෙළ කරන්න:

(i) ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්. (ලකුණු 07)

(ii) අවිනිශ්චිත ගිණුම (ලකුණු 03)

(ලකුණු 10)

## 2022 ජනවාරි ප්‍රශ්න අංක 5

KTI ට්‍රේඩර්ස් යනු අමල්ට අයිති කේවල ස්වාමී ව්‍යාපාරයකි. 2021 මාර්තු 31 දිනට KTI ට්‍රේඩර්ස් හි ශේෂ පිරික්සුම එකඟ නොවූ අතර, වෙනස අවිනිශ්චිත ගිණුමකට බැර කර කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදි. කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන වලට අනුව 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු.2,250,000/- ක ශුද්ධ ලාභයක් වාර්තා කර

පහත දැක්වෙන වැරදි පසුව හඳුනාගන්නා ලදි:

(1) 2021 මාර්තු 31 දින රු.335,000/- ක පිරිවැයකට කාර්යාල උපකරණයක් මිලට ගැනීම, කාර්යාල උපකරණ නඩත්තු ගිණුමට හර කර තිබුණි. මෙය මුදල් පොතේ නිවැරදිව වාර්තා කර තිබුණි.

(2) 2021 අප්‍රේල් මාසයේදි ගෙවන ලද 2021 මාර්තු මාසයට අදාලවන කුලී වියදම වු රු.80,000/- ගිණුම් පොත්වල වාර්තා කර නොතිබුණි.

(3) රු.95,000/- ක් වටිනා ණය පදනමට ගත් ගැනුම් ඉන්වොයිසියක් ගිණුම් පොත්වල සම්පූර්ණයෙන්ම වාර්තා කිරීමට මඟ හැරී තිබේ.



JMC vLearning "your virtual learning partner"

(4) දෛනික විකුණුම් පොතේ එකතුව රු.90,000/- කින් අඩුවෙන් සටහන් කර තිබුණි.

(5) බැංකුවෙන් ලද රු.29,000/- ක පොළී ආදායමක්, පොළී වියදම් ගිණුමට තර කර තිබුණි. නමුත් එය නිවැරදිව මුදල් පොතේ වාර්තා කර තිබුණි.

(6) රු.145,000/- ක් වූ විදුලි වියදම, විදුලි වියදම් ගිණුමේ රු.154,000/- ක් ලෙස සටහන් කර තිබු නමුත්, අදාල බැර සටහන නිවැරදිව සටහන් කර තිබුණි.

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ පිළියෙළ කරන්න:

(i) ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්. (ලකුණු 07)

(ii) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ගලපන ලද/නිවැරදි කරන ලද ශුද්ධ ලාභය ගණනය කරන්න (ලකුණු 03)

(ලකුණු 10)

## 2022 ජූලි ප්‍රශ්න අංක 5

අසාර් ට්‍රේඩර්ස් පිටකොටුවේ පිහිටි තිර රෙදි විකිණීමේ නිරත ව්‍යාපාරයකි. ගිණුම් විධායකයෙකු විසින් පිළියෙල කරන ලද අසාර් ට්‍රේඩර්ස් හි 2022 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම් එකඟ නොවීය. කෙසේ වෙතත්, රු. 45,000/- ක් වූ වෙනස අවිනිශ්චිත ගිණුමකට බැර කර කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදි. අසාර් ට්‍රේඩර්ස් වෙළෙඳ ලැබිය යුතු මුදල් සහ වෙළෙඳ ගෙවිය යුතු මුදල් සඳහා පාලන ගිණුම පවතවාගෙන යයි.

පහත සඳහන් වැරදි පසුව හදුනාගන්නා ලදි:

(1) ගමන් වියදම් සඳහා ගෙවන ලද රු.9,000/- ක මුදලක්, වැටුප් හා වේතන ගිණුමට හර කර තිබුණි. මෙය මුදල් පොතේ නිවැරදිව වාර්තා කර තිබුණි.

(2) රු.129,000/- ක් වටිනා අත්පිට විකුණුම් ඉන්වොයිසියක් නිවැරදට මුදල් පොතේ වාර්තා කර තිබුණි. නමුත් එය විකුණුම් ගිණුමේ සටහන් කර නොතිබුණි.

(3) රු.56,000/- ක රක්ෂණ වාරික ගෙවීම, මුදල් පොතේ පමණක් සටහන් කර තිබුණි.



JMC vLearning "your virtual learning partner"

(4) විකුණුම් ආපසු එවුම දෛනික පොතේ එකතුව රු.8,000/- ක් අඩුවෙන් සටහන් කර තිබුණි.

(5) බැංකුව විසින් බැංකු අයිරා පොලිය ලෙස අයකර තිබූ රු.21,500/- කි. පොලී ආදායම් ගිණුමට බැර කර තිබුණි. නමුත් මෙය මුදල් පොතේ නිවැරදිව වාර්තා කර තිබුණි.

(6) මිලට ගත් පරිගණකයක පිරිවැය වූ රු. 120,000/- ක් පරිගණක නඩත්තු ගිණුමට හර කර තිබූ අතර, එය මුදල් පොතේ නිවැරදිව වාර්තා කර තිබුණි

(7) රු.15,000/-ක දුරකතන වියදම්, දුරකතන වියදම් ගිණුමට දෙවරක් හර කර තිබූ අතර, එයට අදාල බැර සටහන නිවැරදිව වාර්තා කර තිබුණි.

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ පිළියෙළ කරන්න:

(i) ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්. (ලකුණු 07)

(ii) අවිනිශ්චිත ගිණුම (ලකුණු 03)

(ලකුණු 10)

## 2023 ජනවාරි ප්‍රශ්න අංක 5

රන්වන් ට්‍රේඩර්ස් යනු තොග වෙළෙඳ ව්‍යාපාරයකි. සහකාර ගණකාධිකාරීවරයා විසින් 2022 මාර්තු 31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම එකඟ නොවීය. වෙනස වූ රු.139,000/- අවිනිශ්චිත ගිණුමකට හර කර, කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදි. රන්වන් ට්‍රේඩර්ස්, වෙළෙඳ ලැබිය යුතු මුදල් හා වෙළෙඳ ගෙවිය යුතු මුදල් සඳහා පාලන ගිණුම් පවත්වාගෙන යයි.

පහත සඳහන් වැරදි පසුව හඳුනාගන්නා ලදි:

(1) දෛනික විකුණුම් පොතේ එකතුව රු.135,000/- ක් වැඩියෙන් සටහන් කර තිබුණි.

(2) පිරිවැය රු.117,000/- ක් වූ කාර්යාල උපකරණ, සීමාසහිත AT කුරේ සමාගමෙන් ණයට මිලට ගැනීම ලෙජර් ගිණුම් දෙකේම දෙවරක් සටහන් කර තිබුණි.

(3) 2022 මාර්තු මාසය සඳහා රු.65,000/- ක කුළී වියදම, කුළී ආදායම් ගිණුමට බැර කර තිබුණි. මෙය මුදල් පොතේ නිවැරදිව වාර්තා කොට තිබුණි.

(4) රු.65,000/-ක දුරකතන වියදම, මුදල් ගිණුමේ නිවැරදිව වාර්තා කොට තිබුණද, දුරකතන වියදම් ගිණුමට එය රු.56,000/- ක් ලෙස හර කර තිබුණි

(5) රු.220,000/- ක් පිරිවැය වූ ගෘහ භාණ්ඩ මිලට ගැනීම, අළුත්වැඩියා සහ නඩත්තු ගිණුමට හර කර තිබූ අතර, එය මුදල් පොතේ නිවැරදිව සටහන් කොට තිබුණි.

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ පිළියෙළ කරන්න:

(i) ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්. (ලකුණු 07)

(ii) අවිනිශ්චිත ගිණුම (ලකුණු 03)

(ලකුණු 10)

## 2023 ජූලි ප්‍රශ්න අංක 2

අක්මාල් ට්‍රේඩර්ස්, යනු අක්මාල් සතු සිල්ලර ව්‍යාපාරයකි. 2023 මාර්තු 31 දිනට පිළියෙල කරන ලද ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම සමාන නොවීය. මෙම වෙනස, අවිනිශ්චිත ගිණුමට මාරු කර කෙටුම්පත් ගිණුම් පිළියෙල කරන ලදි. කෙටුම්පත් ගිණුම් අනුව, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය රු.1,875,000/- ක් ලෙස වාර්තාකර තිබුණි. අක්මාල් ට්‍රේඩර්ස් වෙළෙඳ ලැබිය යුතු මුදල් සහ වෙළෙඳ ගෙවිය යුතු මුදල් සඳහා පාලන ගිණුම පවත්වාගෙන යනු ලැබේ.

පහත සඳහන් වැරදි සහ මඟ හැරීම පසුවට හඳුනාගන්නා ලදි.

(1) 2023 මාර්තු මාසයට අදාල විදුලි වියදම වන රු.35,000/-, විදුලි වියදම ගිණුමට රු.53,000/- ක් ලෙස හර කොට ඇත. කෙසේවුවද, මීට අදාල බැර සටහන නිවැරදිව සටහන් කොට ඇත.

(2) 2023 මාර්තු මාසයට අදාල රු.135,000/- ක් වන ගෙවිය යුතු කුළී ද්විත්ව සටහන, අදාල ගිණුම් පොත්වල දෙවරක් සටහන් කර ඇත.

(3) දෛනික විකුණුම් පොතෙහි එකතුව රු. 180,000/- ක් අඩුවෙන් සටහන් කර තිබුණි.

(4) බැංකුව විසින් අයකරන ලද රු.2,500/- ක් වූ බැංකු අයිරා පොලිය, පොලී ආදායම් ගිණුමට බැරකොට ඇත. කෙසේ වුවද, මෙය මුදල් පොතේ නිවැරදිව සටහන් කර ඇත

(5) 2023 ජනවාරි 01 දින, රු.150,000/- කට මිලට ගත් පරිගණකයක්, අළුත්වැඩියා සහ නඩත්තු ගිණුමට හර කොට ඇත. කෙසේ වුවද, මෙය මුදල් පොතේ නිවැරදිව සටහන් කර ඇත. පරිගණක, ඒවායේ පිරිවැය මත වාර්ෂිකයට 20% බැගින් සරල මාර්ග ක්‍රමය මත ක්ෂය කරනු ලැබේ.

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ පිළියෙළ කරන්න:

(i) ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්. (ලකුණු 07)

(ii) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අක්මාල් ට්‍රේඩර්ස් හි ගලපන ලද/නිවැරදි කරන ලද ශුද්ධ ලාභය ගණනය කරන්න (ලකුණු 03)

(ලකුණු 10)

# 2024 ජනවාරි ප්‍රශ්න අංක 4

බිමල් ට්‍රේඩර්ස් හි ගිණුම් සහායක විසින් 2023 මාර්තු 31 දිනට පිළියෙළ කරන ලද ශේෂ පිරික්සුම එකඟ නොවීය. වෙනස වූ රු.279,500/- අවිනිශ්චිත ගිණුමකට බැර කර, කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරන ලදී. බිමල් ට්‍රේඩර්ස් වෙළෙඳ ලැබිය යුතු මුදල් හා වෙළෙඳ ගෙවිය යුතු මුදල් සඳහා පාලන ගිණුම් පවත්වාගෙන යයි.

වෙත සඳහා පහත සඳහන් හේතු පසුව හඳුනාගන්නා ලදී.

(1) 2023 මාර්තු මාසය සඳහා ගෙවිය යුතු ආරක්ෂක ගාස්තුව වූ රු.35,000/- ක් ලෙජර් ගිණුම් දෙකෙහිම දෙවරක් සටහන් කර තිබුණි.

(2) ස්ථාවර තැන්පතුවක් මත ලැබුණු රු. 2,750/- ක පොලී ආදායම, වැරදිමකින් පොලී වියදම් ගිණුමට හර කර තිබූ අතර, එය නිවැරදිව මුදල් පොතේ සටහන් කර තිබුණි.

(3) දෛනික ගැනුම් පොත් එකතුව රු.20,000/- ක් වැඩියෙන් සටහන් කර තිබුණි.



JMC vLearning "your virtual learning partner"

(4) රු.250,000/- කට කාර්යාල උපකරණයක් මිලට ගැනීම, කාර්යාල වියදම් ගිණුමට හර කර තිබූ අතර, අනෙක් සටහන ගිණුම් පොත්වල නිවැරදිව සටහන් කර තිබුණි. වර්ෂය සඳහා මෙම කාර්යාල උපකරණය මත ක්ෂය රු. 50,000/- කි.

5) රු.265,000ක අත්පිට විකුණුම්, මුදල් පොතේ පමණක් සටහන් කර තිබූ අතර, අනෙක් සටහන අදාල ලෙජර් ගිණුමේ සටහන් කර නොතිබුණි.

(6) රු.67,000/-ක දුරකතන වියදම්, රු.76,000/- ක් ලෙස දුරකතන වියදම් ගිණුමේ සටහන් කර තිබුණි. නමුත් එය නිවැරදිව මුදල් පොතේ සටහන් කර තිබුණි.

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ පිළියෙළ කරන්න:

(i) ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්. (ලකුණු 07)

(ii) අවිනිශ්චිත ගිණුම (ලකුණු 03)

(ලකුණු 10)

## 2024 ජුලි ප්‍රශ්න අංක 2

පුබුදු ට්‍රේඩර්ස් හි ගිණුම් විධායක විසින් 2024 මාර්තු 31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම, එකඟ නොවූ අතර, වෙනස වූ රු. 27,000/- අවිනිශ්චිත ගිණුමට හර කරන ලදි.

වෙනස සඳහා පහත සඳහන් හේතු පසුව හඳුනාගන්නා ලදි.

(1) 2024 මාර්තු මාසය සඳහා රු.8,000/- ක වැටුප් ගෙවීමක්, මුදල් පොතේ පමණක් සටහන් කර තිබුණි.

(2) රු.6,000/-ක බැංකු ණය පොලිය, මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි. කෙසේ වෙතත්, එය වැරදි ලෙස පොලි ආදායම් ගිණුමට බැර කර තිබුණි.

(3) 2023 ඔක්තෝම්බර් 01 දින, රු.80,000/- කට මිලට ගන්නා ලද මුද්‍රණ යන්ත්‍රයේ වටිනාකම, පරිගණක අළුත්වැඩියා ගිණුමට හර කර තිබුණි. නමුත්, මෙය නිවැරදිව මුදල් පොතේ සටහන් කර තිබේ. සරල මාර්ග ක්‍රමයට, පිරිවැය මත වාර්ෂිකව 10% බැගින් වන මුද්‍රණ යන්ත්‍රයේ අදාල ක්ෂය කිරීම ද ගිණුම් පොත්වල වාර්තා කර නොමැත.

(4) 2024 මාර්තු මාසය සඳහා රු.5,000/-ක උපචිත විදුලි බිලක් අදාල ගිණුම් පොත්වල දෙවරක් සටහන් කර ඇත.

(5) ණය ගැතියන්ට දුන් රු.12,500/-ක වට්ටමක්, ලද වට්ටම ගිණුමට බැර කර තිබුණි. නමුත් මෙය ණය ගැති පාලන ගිණුමේ නිවැරදිව සටහන් කර තිබුණි.

(6) 2024 ජනවාරි මාසය සඳහා ගෙවන ලද රු.24,000/- ක කුළි වියදම, රු.42,000/- ක් ලෙස කුළී වියදම් ගිණුමේ සටහන් කර තිබුණි. නමුත්, එයට අදාල බැර සටහන නිවැරදිව සටහන් කර තිබුණි.

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ පිළියෙළ කරන්න:

(i) ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්. (ලකුණු 07)

(ii) අවිනිශ්චිත ගිණුම (ලකුණු 03)

(ලකුණු 10)



JMC vLearning "your virtual learning partner"

